## වසරේ සුවිශේෂී රංගනය
# සනත් විමලසිරි සමගින්

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික රසිකයනට නවමු අත්දැකීමක් එක්කරමින් අති සාර්ථක ලෙස වේදිකා ගත වූ රශ්මි රාත්‍රිය ඔස්කා සංවිධානයේ දැඩි කැපවීමක ප්‍රතිඵලයක් විය. ප්‍රවීණ රංග ශිල්පි සනත් විමලරිසි ගේ අති මහත් කැපවීම සහ ප්‍රසංගයට සම්බන්ධ වූ ශිල්පීන්ගේ හා ශිල්පිනියන්ගේ උනන්දුව මොනවට ප්‍රදර්ශනය කළ රශ්මි රාත්‍රිය සැඟවුණ කුසලතා රැසක් අප හමුවට ගෙන ආ අති සාර්ථක ප්‍රසංගයක් විය. මේ ඒ ප්‍රසංගය පිළිබඳ ලැබුණ අදහස් කීපයක එකතුවකි.




## අපි උතුරු මෙල්බන් වේදිකා රංගනයට නව මානයක් ගෙන ආවෙමු

මාපියන් වශයෙන් අප දූ දරුවන් වේදිකාවේ දක්වන දස්කම් නරඹමින් උද්ද-ාමයට පත්වෙමු. මාපියන් නිරතුරුවම උත්සුක වනුයේ තම දරුවන්ගේ දස්කම් පෙන්වන්නට අවස්ථා උදා කර දීමටයි. ඔවුන් එසේ කරන්නේ තමන්ගේ ළමා කාලයේදී අත්විඳි එවන් සුන්දර නිමේශයන් මතකටය පමණක් සීමා කොට ගෙන දොරගුළු ලා පසෙක තබමිනි. යෞවනයන් වැඩිහිටියන් හා මාපියන් බවට පත්වන රූපාන්තරණයේදී ඔවුන් වෙලා ගන්නා වගකීම් හා යුතුකම් සමුච්ඡය තමන් තුළ සඟවා ඇති දස්කම් පිළිබඳව තබා තමන් ගැන සිතන්නට තරම්වත් අවකාශයක් ඔවුනට ඉතිරි නොකරයි.

වැඩිහිටියන්ගේ සැඟවුනු දස්කම් මතුකරගන්නට වේදිකාවක් තනා දෙන්නට අප සංවිධානයට හැකිවීම පිළිබඳව මම බෙහෙවින් සතුටට පත්වෙමි. කුඩා දරු දැරියන්ගේත් යෞවන යෞවනියන්ගේත් රංග ප්‍රතිභා අලංකෘත කළේ මාපියන්ගේ හිරු කිරණින් ඒකාලෝක කළේ මාපියන්ගේ වේදිකා ආගමනයයි. ඒ සඳහා ඔවුන් තුළ වූ උනන්දුවත්, කැපවීමත්, දක්ෂතාවත් ප්‍රවීණයන් අතින් ඔප මට්ටම්ව වේදිකා මස්තකාරූඪ වූ මොහොත මා නෙතට සතුටු කඳුලක් නැංවූබව කිව යුතුය. වැඩිහිටියන් තුල සැඟව තිබූ කෞෂල්‍යයන් මට සිළුටු කොට ඔප දමා ගන්නට දැරූ වෑයමට සනත් විමලසිරි සහ ශ්‍රීනාත් මද්දුමගේ යන රංග වේදීනට මාගේ ප්‍රනාමය පුදකරමි. නර්තන නිර්මාණයේ සිට ඒ ඒ නිර්මාණයට දායකත්වය සැපයීමේ හැකියාව ඇති පිරිස සොයා ගැනීමටත්, ප්‍රසංගයේ සියළු සම්බන්ධීකරන කටයුතුවල සිට ප්‍රසංගය පෙළ ගැස්වීම දක්වා වූ කුදු මහත් කර්තව්‍යයන් සියල්ලේ සිට වගකීම් කරට ගත් ශ්‍රීනාත් ප්‍රසංගයක් සංවිධානය කිරීමෙහිලා තමන් තුල ඇති කුසලතාව මනාව පිළිබිඹු කලේය. එමෙන්ම ප්‍රසංගය අරුත් බර ලෙස ඉදිරිපත් කල ශානලි එදිරිසිංහ දියනියත් ජගත් ජේ එදිරිසිංහ සොයුරාත් ප්‍රසංගයට ජීවයක් එක්කල බව කිව යුතුය. ප්‍රසංගයට බෙහෙවින් අලංකාර වූ නෘත්‍යාංග කිරීමට වෙහෙස මහන්සි වූ සරෝජනී නෘත්‍යාචාර්ය පිරිස සහ කලා ශිල්පී අසංක තිලකසිරි ගේ කැපවීම පැසසිය යුතුය. අලංකාර වූ භරත නර්තනයන් නෙත් සිත් ඇද බැඳගත් පැළෑඳ දෙසොහොයුරියන්ගේ රංග කෞෂල්‍යය ඉතා උසස් ය. ආලෝක කරනයෙන් හා ශබ්ද පරිපාලනයෙන් ප්‍රසංගයට උපරිම දායකත්වය ලබා දුන් පුෂ්පිත, රසික සහ සඳමාල් සොයුරන් මෙන්ම වේදිකා පරිපාලනය කළ ශාන්ත සුභසිංහ සොහොයුරාත් එයට සහය වූ දිනේෂ් පෙරේරා සහ හර්ෂ කාරියවසම් සොයුරන්ගේ සහ අනේකවිධ දුක් විඳගනිමින් සහය වූ ඔස්කා සංවිධානයේ සියලුම සොයුරු සොයුරියන්ගේ කැපවීමත් ප්‍රසංගය සාර්ථකත්වයට හේතුවිය.

රශ්මි රාතිය උතුරු මෙල්බර්න් ප්‍රදේශයට අමතක නොවන රැයක් බවට පත් කරන්නට රංගනයෙන් දායක වූ සියයකට අධික සහෙ-ෝදර පිරිසට AUSCA සංගමයේ ප්‍රනාමය මෙසේ පුද කරමි.



**ශ්‍රීයානි ජයවික්‍රම මද්දුමගේ**



මගේ 13 වසරක නිහැඬියාව අහම්බයෙන් වගේ බිඳ වැටුනේ "රශ්මි රාත්‍රිය" තුලින් මගේ කළා ජීවිතයට ලැබුණු ආලෝකයත් සමඟයි. මගේ සේවාස්ථාන මිතුරියන් වන ගංගා හා අංජලී විසින් මා AUSCA සංගමය වෙත හඳුන්වා දෙනු ලැබුවා. නර්තනයට විශේෂ හැකියාවක් නොතිබුණත් වේදිකාවට ගොඩවෙන්නෙ ලැබුණු අහඹු අවස්ථාව අතහරින්න තිබුණු අකමැත්ත නිසාම මම නර්තන අංගයට ඉදිරිපත් වුනා. මගේ නර්තන පුහුණු වීම් දුටු පළමු දිනයේද සිය සහජ කළා ඉවෙන් (Instinct) මගේ රංගන කෞෂල්‍යය හඳුනාගත් ශ්‍රීනාත් මද්දුමගේ මහත්මා මට නාට්‍යකට ආරාධනා කළා. ඉබ්බා දියට දැම්මම ඇන්නෑවේ කියන්නා වාගේ මම එක පයින්ම කැමතිවුනා. මට මේ කාර්යය පහසු නොවුනත් මගේ ස්වාමියාගෙන්, යහළු යෙහෙළියන්ගෙන් උදව්, උපකාර අතුව පුහුණුවීම් කටයුතුවල යෙදුණා. මගේ රංගනයට වගේම නර්තනයටත් උණුසුම් ප්‍රතිචාර ගලාගෙන එනවා. මේක එක විදියකට මගේ හීනයක් හැබෑ වුනා කියලා කියන්න පුළුවන්. "රශ්මි රාත්‍රිය" නොවූවා නම් මගේ දක්ෂතා කිසිවකුත් නොදැක, නොදැන මාත් එක්කම පොළොවට පස්වෙන්නත් ඉඩ තිබුනා. වසර 13 ක නිහැඬියාව බිඳ දැමුවේ ලංකාවේ ප්‍රකට හා දක්ෂ කලාකරුවන් දෙදෙනෙකු සමඟ වේදිකාව මත පෙනී සිටීම වීමත් විශේෂ වාසනාවක් ලෙසයි මා දකින්නේ.



**රසිකා හර්ෂනී දහම්පොඩි**

"රශ්මි රාත්‍රිය" ප්‍රසංගය මට දැනෙන්නේ නැවත මගේ අතීතයට යාමක් වගෙයි. පාසැලෙන් සහ සරසවියෙන් පසු අත්හිටවුනු ප්‍රසංග පැවැත්වීමේ කලාවට නැවත ඉඩක් ලැබුනේ රශ්මි රාත්‍රියෙන්. ඉතා අවිවේකී මෙල්බර්න් ජීවිතයෙන් මඳක් මිදී, සුන්දර යෙහෙළියන් හත්දෙනෙක් සමඟ නර්තනය කරන්නට ලැබීම විශාල සතුටක්. මෙවැනි ප්‍රසංගයක් පැවැත්වීම පිළිබඳ ඔස්කා සංවිධානයටත්, සනත් විමලසිරි සොයුරාටත් මගේ ප්‍රණාමය !

**ගංගා දැඩිගොමුව**

## සහභාගිවීමත් සතුටක්

අපේ කමට එහෙමත් නැතිනම් ශ්‍රී ලාංකික උරුමයට වටිනාකමක් දෙන්න, ඔස්කා සංවිධානය ගත් පියවර සඳහා එහි ක්‍රියාකාරී සංවිධායක මණ්ඩලයට මාගේ කෘතවේදී ප්‍රණාමය මුලින්ම පුද කිරීමට කැමැත්තෙමි.
ප්‍රවීණ, අතිදක්ෂ කලාකරුවන් දෙපලක් වන සනත් විමලසිරි මහතා සහ ශ්‍රීනාත් මද්දුමගේ මහත්වරුන් සමග ඔවුන්ගේ ගුරුහරුකම් මැද වැඩ කිරීමට ලැබීම ජීවිතයේ මා ලද මහත් වටිනා අත්දැකීමක් සේම භාග්‍යයකි. ඒ ආදරණීය මිනිසුන්ගේ නිහතමානීකම සැමදා අගය කරමි. ඉතා කෙටි පුහුණු කාලයකින් මෙතරම් සාර්ථක නිර්මාණ එලිදැක්වීමට ප්‍රධාන හේතුව ඔවුන්ගේ අතිමහත් කැපකිරීම බව විශ්වාස කරමි. ප්‍රවීණ, ආධුනික පරතරයක් නැතිව, වයස් පරතරයක් නැතුව ඉතාම මිත්‍රශීලීව ගෙවීගිය දින කීපය සැබැවින්ම සුන්දරය.
සහෝදරකමේ, එකමුතුකමේ, අසීමිත කැපකිරීමේ අවසන් ප්‍රතිඵලය වශයෙන් එලිදැක්වූ මෙම ප්‍රසංගයට පුංචි හෝ දායකත්වයක් ලබාදීමට අවස්ථාව ලැබීම මහත්වූ සතුටට කරුණකි.

**ධරණි දිසානායක** නර්තන ශිල්පිණී





### විශිෂ්ටයි

මේ මෑත කාලයේ මෙල්බන් වේදිකාවක මා දුටු හොඳම ප්‍රසංගයයි. ඉදිරිපත් කළ ඔබ සැමට ස්තුතියි.

**අමිල ජයනෙත්ති**
ප්‍රේක්ෂකයෙක්....

සොයුරු සොයුරියන් මෙන් එකමුතු වු වා
වෙහෙස මහන්සිය එසැනින් දුරු වූ වා
මෙලෙසින් අනාගතයෙත් යලි එක් වේ වා
AUSCA කැදැල්ලත් සැමදා බැබලේ වා

**රුචිරා අඹේගොඩ**









Photography: Sameera Vithanage, Samee N Chami Photography
Deepal Gunawardhana
Video coverage: Vijitha Kumara,